නැණ සයුර අධ්‍යාපනික වැඩසටහන

උතුරුමැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

2021 (2022 මැයි) අ.පො.ස. (සා.පෙළ) ඉලක්ක කරගත්
පෙරහුරු පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර අංක :- 02

11 ශ්‍රේණිය | ලකුණු දීමේ පටිපාටිය | 63 | S | I,II

# ව්‍යවසායකත්ව අධ්‍යයනය I

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | - | (3) | 11 | - | (2) | 21 | - | (1) | 31 | - | (1) |
| 02 | - | (2) | 12 | - | (1) | 22 | - | (4) | 32 | - | (2) |
| 03 | - | (3) | 13 | - | (3) | 23 | - | (3) | 33 | - | (2) |
| 04 | - | (1) | 14 | - | (4) | 24 | - | (1) | 34 | - | (4) |
| 05 | - | (2) | 15 | - | (1) | 25 | - | (2) | 35 | - | (4) |
| 06 | - | (4) | 16 | - | (3) | 26 | - | (4) | 36 | - | (2) |
| 07 | - | (3) | 17 | - | (2) | 27 | - | (2) | 37 | - | (1) |
| 08 | - | (4) | 18 | - | (4) | 28 | - | (3) | 38 | - | (3) |
| 09 | - | (2) | 19 | - | (2) | 29 | - | (4) | 39 | - | (1) |
| 10 | - | (2) | 20 | - | (3) | 30 | - | (3) | 40 | - | (3) |

# ව්‍යවසායකත්ව අධ්‍යයනය II

01. (i) සිය මුත්තනුවන්ගේ බල කිරීම මත

(ii)
- ★ මුළු ලෝකයෙන්ම Covid වසංගතය තුරන් කිරීම
- ★ තම නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳපොලට ඉදිරිපත් කිරීම / ලෝකය පුරා බෙදාහැරීම

(ගැළපෙන පිළිතුරට ලකුණු ලබාදෙන්න.)

(iii)
- ★ ජීව විද්‍යා අංශයෙන් උසස් පෙළ හැදෑරීම
- ★ සිය මුත්තනුවන් දේශීය වෙද මහතෙකු වීම

(iv)
- ★ මුව ආවරණ නිෂ්පාදනය
- ★ සැනිටයිසර් නිෂ්පාදනය
- ★ ආරක්ෂිත ඇඳුම් නිෂ්පාදනය
- ★ සනීපාරක්ෂක ද්‍රව්‍ය නිෂ්පාදනය
- ★ ශීතාගාර හා ශීතකරණ

(v) ★ උනන්දුව ★ කැපවීම ★ දැඩි අධිෂ්ඨානය
★ නිර්මාණශීලිත්වය ★ නම්‍යශීලී බව

(vi) මුළු ස්ථාවර වත්කම්වල වටිනාකම රු. 345 000

(ඖෂධ කැබලි කිරීමේ යන්ත්‍රය + තෙල් නිෂ්පාදනය හා බෝතල් කිරීමේ යන්ත්‍රය
150 000 + 195 000)

(vii) මුළු නිෂ්පාදන පිරිවැය

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය | රු. | 30 000 |
| ඇසුරුම් ද්‍රව්‍ය | රු. | 10 000 |
| සේවක වැටුප් | රු. | 15 000 |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | රු. | 11 500 |
| | රු. | 66 500 |

(viii) මුළු නිෂ්පාදන නොවන පිරිවැය

| | | |
|---|---|---|
| ගොඩනැගිලි අලුත්වැඩියා | රු. | 95 000 |
| ලිපිද්‍රව්‍ය | රු. | 3 100 |
| විදුලිය | රු. | 2 100 |
| ප්‍රවාහන | රු. | 10 800 |
| | රු. | 111 000 |

(ix) ඒකක පිරිවැය $= \dfrac{\text{මුළු නිෂ්පාදන පිරිවැය + මුළු නිෂ්පාදන නොවන පිරිවැය}}{500}$

$= \dfrac{66\ 500 + 111\ 000}{500}$

$= \dfrac{177\ 500}{500}$

= රු. 355.00

(x) තෙල් කුප්පි නිෂ්පාදනයෙන් ලද ලාභය,

නිෂ්පාදිත ඒකක ප්‍රමාණය 500
ඒකකයක විකුණුම් මිල රු. 500

| | | | |
|---|---|---|---|
| විකුණුම් ආදායම 500 × 500 | = | රු. | 250 000 |
| මුළු පිරිවැය | = | රු. | 177 500 |
| | | රු. | 72 500 |

02. (i) නැත.

වව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර ඕනෑම වෙනස්කම් 02 ක් සඳහන් පිළිතුරට ලකුණු ලබාදෙන්න.

(ii)
- ★ ආයතනයේ විවිධ පාර්ශ්වයන් අතර තොරතුරු බෙදාහැරීමට
- ★ අවශ්‍ය තොරතුරු රැස් කරගැනීමට
- ★ ඒවා ක්‍රමානුකූලව වාර්තා කිරීමට

(iii)
- ★ සම්පත් සැපයීම
- ★ අවදානම් දැරීම
- ★ තීරණ ගැනීම

(iv)
- ★ විශ්වාස හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටීම
- ★ ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම
- ★ යම් ගැටළුවකට එක්ම විසඳුමක් පමණක් ඇතැයි සිතීම
- ★ ප්‍රායෝගික වීමට බාධා ඇතැයි සිතීම
- ★ වැරදීම් හා විවේචන සඳහා ඇති බිය
- ★ රීති හා සම්ප්‍රදායන් අනවබෝධයෙන් පිළිපැදීම
- ★ තර්කානුකූල පදනමක් මත පිහිටා කටයුතු නොකිරීම

(v)
- ★ අනපේක්ෂිත සිදුවීම්
- ★ ක්‍රියාවලි අවශ්‍යතා
- ★ වෙළෙඳපොලේ වෙනස්වීම්
- ★ ප්‍රජා පරිසරයේ හා ජන ජීවිතයේ වෙනස්කම්
- ★ සංජානනය හෙවත් තේරුම් ගන්නා ආකාරය වෙනස්වීම
- ★ දැනුම පදනම් කරගත් සංකල්ප

03. (i)
- ★ ස්වකීය ඉතුරුම්
- ★ ස්වකීය වත්කම් යෙදවීම හෝ විකිණීම
- ★ නෑදෑ හිත මිතුරන්ගෙන්
- ★ බැංකු ණය සහ කල්බදු
- ★ ගනුදෙනුකරුවන්ගේ අත්තිකාරම් ලබාගැනීම

(ii)
- ★ ගනුදෙනුකරුවන් ප්‍රමාණය හා ඔවුන්ගේ විසිරීම
- ★ අමුද්‍රව්‍ය ලබාගැනීමේ පහසුව
- ★ ශ්‍රමය ලබාගැනීමේ පහසුව
- ★ යටිතල පහසුකම් ලබාගැනීමේ පහසුව
- ★ පාරිභෝගිකයින්ට සැපයිය හැකි පහසුකම් (රථගාල්, සනීපාරක්ෂක පහසුකම්)
- ★ භූමියේ පිරිවැය (මිල / බදු කුලී)

(iii)
- ★ පවතින භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළෙඳපොලට සැපයීම
- ★ පවතින භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළෙඳපොලට සැපයීම
- ★ නව භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළෙඳපොලට සැපයීම
- ★ නව භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළෙඳපොලට සැපයීම

(iv) **A** - කුඩා දෙයක් විශාල කිරීම

**M** - විශාල දෙයක් කුඩා කිරීම

(v) වෙළෙඳපොළ හිඩැස යනු තෘප්තිමත් නොවූ අවශ්‍යතා හා වුවමනා සහිතව පසුවන පාරිභෝගික කොටසයි.

04. (i)
- ★ විනෝදාංශ හා ලැදියා තුළින්
- ★ පුද්ගල දක්ෂතා හා පළපුරුද්ද තුළින්
- ★ වෙළෙඳපොල සමීක්ෂණය තුළින්
- ★ පාරිභෝගික ප්‍රතිචාර තුළින්
- ★ නිර්මාණශීලී චින්තන හැකියා තුළින්
- ★ ජනමාධ්‍ය මඟින්
- ★ සැපයුම්කරුවන් ඇසුරින්
- ★ අධ්‍යාපනික පාඨමාලා තුළින්
- ★ ප්‍රදර්ශන හා අත්දැකීම් තුළින්
- ★ තරඟකාරීත්වය අධ්‍යයනය කිරීම තුළින්

(ii)
- ★ ව්‍යාපාරයේ සියලු වියදම් පියවා ගැනීමට
- ★ අයිතිකරුවන්ට ප්‍රමාණවත් ලාභයන් ලබාදීමට
- ★ ව්‍යාපාරයේ අනාගත දියුණුව සඳහා ප්‍රතිආයෝජනයට

(iii) ආර්ථික ප්‍රතිලාභ :-
- ★ රැකියා උත්පාදනය
- ★ දේශීය සම්පත් භාවිතා කිරීම
- ★ ආදායම් විෂමතාව අඩු කිරීම
- ★ නව භාණ්ඩ හා සේවා වෙළෙඳපොලට ඉදිරිපත් කිරීම
- ★ ආර්ථික සංවර්ධනයට දායක වීම

සමාජ ප්‍රතිලාභ :-
- ★ ජනතාවගේ ජීවන මට්ටම ඉහළ යාම
- ★ නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථා උදා වීම
- ★ පවුල්වල ආදායම ඉහළ යාම

(iv)
- ★ පාරිභෝගිකයින්ගේ රුචි අරුචිකම්
- ★ මිලදී ගැනීමේ හැකියාව
- ★ වයස් ව්‍යුහය
- ★ ස්ත්‍රී / පුරුෂ භේදය
- ★ ආගම් අනුව

(v) ශ්‍රමය - සේවකයින්

භූමිය - ව්‍යාපාර ස්ථානය පිහිටා ඇති ඉඩම

ප්‍රාග්ධනය - මුදල්, අභ්‍යාස පොත් මුද්‍රණ යන්ත්‍ර හා අනෙකුත් උපකරණ

ව්‍යවසාය - පොත් එකලස් කරන්නා

05. (i)
- ★ සීමිත සම්පත් භාවිතා කිරීම
- ★ ආර්ථික කටයුත්තක නියැලීම
- ★ මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම
- ★ භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය කිරීම
- ★ භාණ්ඩ හෝ සේවා අලෙවි කිරීම හා බෙදාහැරීම

(ii)
- ★ එක් පුද්ගලයෙකුට වුවද ආරම්භ කළ හැකි වීම
- ★ සමාගමේ ලාභය සුළු පිරිසක් අතර පමණක් බෙදී යාම
- ★ වගකීම සීමාසහිත වීම
- ★ නෛතික පුද්ගලභාවයක් හිමි වීම
- ★ අඛණ්ඩ පැවැත්මක් තිබීම
- ★ විධිමත් බවක් හා ඉහළ පිළිගැනීමක් තිබීම
- ★ පවුලේ අය, නෑදෑ හිතු මිතුරන් සම්බන්ධ කරගනිමින් ආරම්භ කළ හැකි වීම
- ★ හිමිකාරිත්වය සුළු පිරිසක් සතු වීම නිසා පාලනය පහසු වීම

(iii)
- ★ ඉදිරිපත් කිරීමට අපේක්ෂිත භාණ්ඩය හෝ සේවාවට ඇති ඉල්ලුම
- ★ ඉලක්කගත පාරිභෝගිකයන්
- ★ තරඟකරුවන්ගේ ස්වභාවය
- ★ තරඟකරුවන්ගේ අලෙවි උපක්‍රම

(iv)
- ★ සාර්ව විශ්ලේෂණය
- ★ සූක්ෂම විශ්ලේෂණය
- ★ ශදුඅත විශ්ලේෂණය

(v)
- ★ ශදුඅත විශ්ලේෂණය යනු ව්‍යාපාර පරිසරය මනාව අධ්‍යයනය කිරීම තුළින් තම ව්‍යාපාරය සම්බන්ධයෙන් පවතින ශක්තීන්, දුර්වලතා, අවස්ථා, තර්ජන පිළිබඳ අවබෝධ කරගැනීමයි.
- ★ ශ - ශක්තීන්
  දු - දුර්වලතා
  අ - අවස්ථා
  ත - තර්ජන

06. (i)
- ★ ව්‍යාපාරයේ නම, කර්මාන්ත ක්ෂේත්‍රය කුමක්ද යන්න ඉතා කෙටියෙන්
- ★ අලෙවිකරණ සැලසුමේ සාරාංශය
- ★ නිෂ්පාදන සැලසුමේ සාරාංශය
- ★ පරිපාලන සැලසුමේ සාරාංශය
- ★ මූල්‍ය සැලසුමේ සාරාංශය
- ★ ව්‍යාපාරයේ සුවිශේෂිභාවය ඉතා කෙටියෙන්
- ★ ව්‍යාපාර සැලසුම සකස් කර ඉදිරිපත් කිරීමේ පරමාර්ථ හා අරමුණු ඉතා කෙටියෙන්

(ii)
- ★ ව්‍යාපාරයක විවිධ අංශවල ඇති තනතුරු දැක්වීමට
- ★ එම තනතුරු දරණ අයට අයත් කාර්යයන් දැක්වීමට
- ★ ඒවායේ වගකීම් හා අදාළ සුදුසුකම් නිශ්චිතව දැක්වීමට

(iii) ★ සුවිශේෂී නව භාණ්ඩයක් හෝ සේවාවක් වීම
★ නිෂ්පාදිත ප්‍රභේදනය
★ වෙළෙඳපොල හිඩැස / අවකාශය
★ නවෝත්පාදනය

(iv) ★ භූමිය සැකසීම සඳහා දරණ වියදම්
★ ජලය, විදුලිය වැනි පහසුකම් ලබාගැනීමට දරණ වියදම්
★ පාරිභෝගික අවශ්‍යතා හා තරඟකරුවන් පිළිබඳව අධ්‍යයනය කිරීමට දරණ ලද වියදම්
★ ලිපි ලේඛන හුවමාරු වීමේ වියදම්
★ සාම්පල් පරීක්ෂාව සඳහා යන වියදම්
★ ලියාපදිංචි ගාස්තු හා බලපත්‍ර ගාස්තු

(v) ★ ඇප සුරකුම් සහිත ණය ලබාදීම
★ සහන පොළී අනුපාතයක් යටතේ ණය පහසුකම් ලබාදීම
★ ණය ආපසු ගෙවීමේ කාල සීමාව වැඩි කිරීම
★ මූල්‍යමය ප්‍රදානයන්

07. (i) මුළු ස්ථාවර වත්කම්වල වටිනාකම,

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිල්ල | රු. | 100 000 | |
| මහන මැෂිම | රු. | 24 500 | |
| ලී රාක්ක | රු. | 10 200 | |
| | රු. | 134 700 | (ලකුණු 03) |

(ii) ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර දරණ ලද වියදම්වල වටිනාකම,

| | | | |
|---|---|---|---|
| ජල සැපයුම ලබාගැනීම | රු. | 18 000 | |
| විදුලි සම්බන්ධතාව ලබාගැනීම | රු. | 25 000 | |
| ව්‍යාපාර සැලැස්ම සැකසීම | රු. | 8 000 | |
| ලියාපදිංචි ගාස්තු | රු. | 9 550 | |
| | රු. | 60 550 | (ලකුණු 03) |

(iii) මුළු කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව,

| | | | |
|---|---|---|---|
| දෛනික සේවක වැටුප් | රු. | 30 000 | |
| අනෙකුත් දෛනික වියදම් | රු. | 21 000 | |
| | රු. | 51 000 | (ලකුණු 02) |

(iv) මුළු ආයෝජන මුදල,

| | | | |
|---|---|---|---|
| ස්ථාවර වත්කම් | රු. | 134 700 | |
| පෙර වියදම් | රු. | 60 550 | |
| කාරක ප්‍රාග්ධනය | රු. | 51 000 | |
| | රු. | 246 250 | (ලකුණු 02) |

***